බ:කො:ජ චක්‍රලේඛ අංක :- 11 /2013

මගේ අංකය -එස්.ඩබ්.ඩී/රැඳවීම්/01/2013,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ -09,

2013-02-26 දින.

සියලුම බන්ධනාගාර අධිකාරී/සහකාර අධිකාරීන් වෙත.

## රැඳවිය හැකි සංඛ්‍යාව.

සියලුම බන්ධනාගාර ආයතනයන්හි රැඳවිය හැකි නේවාසික සංඛ්‍යාව සම්බන්ධව නිසියාකාර යාවත් කාලීන තොරතුරු බන්ධනාගාර මූලස්ථානයේ නොමැති බැවින්, බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණපනත් 179 ට යොමුව සහ බන්ධනාගාර කොමසාරිස් 2001-12-31 දිනැති ලිපියට යොමුව පහත සඳහන් පරිදි සඳහන් වියයුතුය.

1) සෑම සිර මැදිරියක්ම දිග අඩි 9 x 6 x10 - 540 (ඝණ අඩි 540) නොඅඩු වියයුතුය.

2) රැඳවියන් සඳහා සෑම බන්ධනාගාර ශාලාවකම(වාට්ටු) එක් රැඳවියෙකු සඳහා තිබියයුතු වර්ග ප්‍රමාණය ( දිග අඩි 08 x පළල අඩි 03 - වර්ග අඩි 24) එම ගොඩනැගිල්ල උස අවම වශයෙන් අඩි 10 ක් වියයුතුය.

මෙසේ ගණනය කිරීමේදී වාට්ටු තුලඇති වර්ග අඩි ප්‍රමාණය පමණක් උපකල්පනයකර ගණනය නොකල යුතුඅතර, එහි ඇති ජල ටැංකි, වැසිකිළි, ආලින්ද ඇතුලු වෙනත් ඉඩ ප්‍රමාණයන් අතහැර ගණනය කලයුතුය. ආයතන අධිකාරීවරයා මේ සම්බන්ධව පුද්ගලික අවධානය යොමු කලයුතු අතර, එසේ වාර්තා කිරීමෙන් අනතුරුව, ඉදිරියේදී මෙසේ රඳවා තැබීම සම්බන්ධව යම් වෙනසක් සිදුකරන්නේ නම් ඒ පිළිබඳව නොපමාව බන්ධනාගාර මූලස්ථානය වෙත දැන්වීමට කටයුතු කරනලෙස දන්වමි.

ඉහත සඳහන් තොරතුරු වලටඅනුව ඔබ ආයතනය සහ අනුබද්ධ ආයතනයන්හි රැඳවියහැකි සංඛ්‍යාව නිවැරදිව ගණනයකර එම තොරතුරු නොපමාව බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන්න.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්